www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා හමුදාව කොළඹ පීරමින් දැවැන්ත දෙමල විරෝධී මෙහෙයුමක් දියත් කරයි

## Sri Lankan military conducts massive anti-Tamil sweep through Colombo

**කේ. රත්නායක විසිනි**
**2007 දෙසැම්බර් 05**

ශ්‍රී ලංකා ආන්ඩුව මෙතෙක් පැවැති විශාලතම වට කර සෝදිසි කිරීමේ මෙහෙයුම ඉරිදා කොලඹ දියත් කලේ ය. මෙ මගින් විශේෂයෙන් දෙමල ජාතිකයින් ඇතුලුව සිය ගනන් මහජනයා රඳවා ගනු ලැබූ අතර, රට පුරා ජාතිභේදවාදී ආතතිය උග්‍ර කලේ ය. මෙම මෙහෙයුම සඳහා ක්ෂනික ව්‍යාජ නිමිත්ත ලෙස සැලකුනේ පසුගිය සතය තුල කොළඹ සහ නුගේගොඩ අසල බෝම්බ පිපිරීම් සඳහා චෝදනා ලබා ඇති ද්‍රවිඩ විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) "ශුද්ධ කර" දැමීම ය.

බටහිර පලාත්භාර හමුදා මූලස්ථානය කොලඹ මෙහෙයුම් නාමිකව භාරව සිටිය ද, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ගේ උපදෙස් මත ක්‍රියාත්මක වන ඉහල හමුදා තන්ත්‍රය දැවැන්ත මෙහෙයුම සැලසුම් කිරීම සඳහා ඍජුවම මැදිහත් විය. ජනාධිපති මහින්ද රාජපක්ෂගේ සොහොයුරා වන ආරක්ෂක ලේකම් පසුගිය දෙවසර පුරා රට නැවතත් යුද්ධයක ගිල්වීම සඳසා වඩා සමීපව සම්බන්ධ වූවෙකි.

දෙමල ජාතිකයින් බහුතරයක් වෙසෙන කොටහේන, වැල්ලවත්ත, බම්බලපිටිය, කිරුලපන, නාරාහේන්පිට සහ පිටකොටුව ඇතුලුව කොළඹ මෙන්ම දෙහිවල, ල්කිස්ස, රත්මලාන, වැල්ලම්පිටිය සහ නුගේගොඩ තදාසන්න ප්‍රදේශ පීරීමේ මෙහෙයුම සඳහා බලගතුව සන්නද්ධ වූ හමුදා සහ පොලිස් භටයින් 18,000 ක් බලමුලු ගන්වා තිබින. බොහෝ පදිංචිකරුවෝ දෙමල ජාතිකයෝ වූ අතර මොවුන් උතුරු නැගෙනහිර පලාත්වලින් පලා වූවන් හෝ රැකියා සොයමින් මධ්‍යම කඳුකරයෙන් පැමිනි වතු දෙමල කම්කරුවෝ වූහ. රටේ අනෙකුත් ස්ථාන වලද මෙහෙයුම් සිදු කෙරින.

කොළඹ කරා පවතින සියලුම මාර්ග මාර්ග බාධක යොදමින් අවහිර කර තිබින. වාහන සහ ඒවාහි සිටි මගීන් පරීක්ෂා කෙරින. ඕනෑම දෙමල ජාතිකයකු සැක කරුවෙක් ලෙස සැලකුනි.

බස් වල ගමන් කරමින් සිටි බොහෝ දෙමල ජාතිකයින් අත් අඩංගුවට ගන්නා ලදී. ඇසින් දුටු සාක්කි සඳහන් කලේ "අපට දෙමල ජාතිකයකු හමු වුනොත් රඳවා ගන්නවා" යනුවෙන් පොලීසිය පැවසූ බව ය. සමස්ථයක් ලෙසම කාන්තාවන් සහ දරුවන් 2,000කට අධික සංඛ්‍යාවක් රඳවා ගත්තවුන් පසුව පොලීසි වෙත ගෙනයන ලදී. සඳුදා පාර්ලිමේන්තුවේ කථා කරමින් විරුද්ධ පක්ෂ මන්ත්‍රීවරයකු වන මාවයි සේනාධි රාජ පැවසුවේ සාක්කි කිසිවක් නොතිබුනද බූස්ස කඳවුර වෙත කාන්තාවන් 41ක් ඇතුලු 419 ක් යවනු ලැබ තිබිනු බව ය. බූස්ස පිහිටා ඇත්තේ රටේ බහුතරයක් සිංහල ජනයා වෙසෙන දකුනේ ය.

එල්ටීටීඊ ගැති දෙමල ජාතික සංධානයේ (දජාස) සේනාධිරාජ කියා පෑවේ දැනටමත් සිය ගනන් සිර කරුවන් රඳවා ඇති බූස්ස කඳවුරේ ප්‍රමානවත් පානිය ජලය, ප්‍රමානවත් වැසිකිලි පහසුකම් හෝ නිදා ගැනීම සඳහා කාමර මෙම රැඳවියන්ට ලබා නොදුන් බව යි. ඉරිදා අත් අඩංගුවට ලක් වූ අනෙකුත් අය කොළඹ පොලිස් කුඩු වල තවමත් කොටු වී සිටිති.

සුලුතර දෙමල ජනතාව ක්‍රමානුකූලව නිල වශයෙන් සිදු කෙරෙන වෙනස්කම් කිරීම් වලට ගොදුරු වෙමින් සිටිති.

කොළඹට පැමිණෙන දෙමල ජාතිකයෝ තමන් පදිංචිව සිටින ප්‍රදේශවල පොලිස් ස්ථාන වල ලියා පදිංචි වීමට බල කෙරී ඇත. ඒ කෙසේ වෙතත් ඉරිදා, මෙම කොන්දේසි සැපිරි අයට පවා කිසිදු සමාවක් නොලැබිනි.

පසුගිය දෙවසර පුරා නඩු රහිතව කාල නියමයක් නොමැතිව රඳවා තබා ගැනීමට අවසර දෙන ත්‍රස්ත විරෝධී නීති යලි පනවමින් ද එයට විස කවමින්ද රාජ පක්ෂ ආන්ඩුව හදිසි නීතිය පවත්වා ගෙන යයි. ආරක්ෂක හමුදා සමග ඇසුරු කරන අර්ධ හමුදා කල්ලි මගින් කොළඹ ජීවත් වන දෙමල ජනතාව කප්පම් ගැනීම් වලට, ද පැහැර ගැනීම් වලට ද ඝාතනවලට ද ගොදුරු කෙරෙයි.

හමුදාව දෙමල ජනතාව වෙසෙන කොළඹ ප්‍රදේශ වට ලෑම දිගටම කරගෙන යති. නිවැසියන් වෙසෙන මාර්ග දෙපස යොදවනු ලැබූ හමුදාව නිවාස ප්‍රදේශ වල දොරටු පරීක්ෂා කරමින් සිටිති. නිවැසියෝ අප

වාර්තාකරුවනට පැවසුවේ තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීමට සිදු වන බව ත් රාත්‍රි 9න් පසුව සත්‍ය වශයෙන්ම ඇඳිරි නීතියට යටත් කෙරෙන බවත් ය. සමහර පාසැල් අවට හමුදාව යොදවනු ලැබ ඇත.

මෙහෙයුම පුලුල් ලෙස කෝපය අවුස්සා ඇත. යුද්ධයට නිහඬ ව සහය දෙන විරුද්ධ පක්ෂ එක්සත් ජාතික පක්ෂය ආන්ඩුවේ තම අත්තනෝමතික ක්‍රියාවන් ටන සඳුදා පාර්ලිමේන්තුව තුල විවේචනය කලේ ය.

අත් අඩංගුවට ගැනීම් "අසාධාරණ" බව සිංහල ස්වෝත්තමවාදී ජනතා විමුක්ති පෙරමුණ පවා ප්‍රකාශ කල අතර ඒ සමගම එල්ටීටීඊ යේ ක්‍රියාවන් ට දජාස එරෙහි නොවන බවට විවේචනය කලේ ය.

ආන්දෝලනය අහෝසි කිරීමේ ප්‍රයත්න දරන ආන්ඩුවේ ප්‍රධාන පාර්ලිමේන්තු සංවිධානක ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ නිවේදනය කලේ 2,000 කට ඉක්මවූ රැඳවියගෙන් 1,600 ක් පමණ නිදහස් කරන බව නමුත් මෙවැනි මෙහෙයුම් අනාගතයේ දී ඇති වන බවට ද අනතුරු ඇඟවීය. "ත්‍රස්තවාදීන්ගෙන්" අහිංසක ජනතාව තෝරා බේරා වෙන් කර ගැනීමේ ක්‍රියාවලියට උදව් කරන ලෙස ඔහු විරුද්ධ පක්ෂවලට ද ආයාචනය කලේ ය.

තම වර්ග භේදවාදී මර්ධනය යුක්ති සහගත කිරීම සඳහා ආන්ඩුව නොවෙම්බර් 28 සිදු වූ බෝම්බ පිපිරීම් දෙක භාවිතා කලේ ය. පලමු වැන්න සිදු වූයේ ඊලම් මහජන ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායක සමාජ සේවා ඇමති ඩග්ලස් දේවානන්දගේ කාර්යාලය අසල ය. පාලක සභාගයේ හවුල් පක්ෂයක් වන මෙහි අර්ධ සන්නද්ධ ඒකක හමුදාව සමග මෙහෙයුම් වල යෙදෙති.

දේවානන්දගේ සම්බන්ධී කරණ ලේකම් මරණයට ගොදුරු කරමින් ද අනෙකුත් කිහිප දෙනෙකු තුවාල කරමින් ද සිය දිවි නසා ගන්නා කාන්තාවක් කාර්යාලය ඇතුලත පුපුරුවා ගත්තීය. මෙයට එල්ටීටීඊය වගකීම භාර නොගත් අතර, මෙම පුපුරවා ගැනීම ඔවුනගේ සියදිවි හානිකරන මෙහෙයුම් වල ප්‍රධාන ලක්ෂනය කි. දේවානන්දගේ ජීවිතය සඳහා මීට පෙර කිහිප විටක් අසාර්ථක ප්‍රයත්නයන් හි යෙදින.

දෙවන පිපිරීම සිදු වූයේ කොළඹ තදාසන්න පිහිටි නුගේගොඩ විශාල රෙදි පිලි සාප්පු සංකීර්නයක හවස 6.05 වෙයි. ඇසින් දුටු සාක්කි අනුව, කෙනෙකු ඇතුල් වී, සාප්පු කවුන්ටරය අසල පාර්සලයක් තබා පසුව අතුරුදහන් වී ඇත. කලමනාකරු හදිසි ආරක්ෂක දුරකථන අංක වලට දැනුම් දුන් අතර, විනාඩි 30 ක් යන තුරුම පොලීසිය පැමිණියේ නැත. අසල සිටි රථ වාහන පොලිස් පරීක්ෂකයකු අපරීක්ෂාකාරීව මෙම පාර්සලය පරීක්ෂා කිරීමට තැත් කිරීමේදී බෝම්බය පිපිරින. දහසයක් එතැනම ජීවිතක්ෂයට පත් වූ අතර තුවාල වලින් තවත් පස් දෙනෙකු මියි යහ.

දෙවන පිපිරීම සඳහා ද්‍රවිකොස වගකිව යුතු බවට ඍජු සාක්ෂි නොමැත. ඒ කෙසේ වෙතත් බෝම්බ දෙකම පුපුරා ගියේ ද්‍රවිකොස නායක වී ප්‍රභාකරන් තම වාර්ෂික මහා විරු කථාව සිදු කර දිනකට පසුව ය. මෙහිදී ඔහු ආන්ඩුව විසින් යලි ආරම්භ කරන ලද යුද්ධය සඳහා සිංහල ජාතිය වෙත දොස් පැවරූ අතර 2002 සටන් විරාම ගිවිසුම අවසන් බව ද නිවේදනය කලේ ය.

දෙමල ජනතාවට එරෙහි හමුදාවේ දාමරික වැඩ වලට එරෙහි ව පලි ගැනීමක් ලෙස එල්ටීටීඊ ය මෙයට පෙරද සාමාන්‍ය සිංහල ජනතාව ඉලක්ක කර ත්තේය. වැඩ කරන ජනතාව තුල වර්ගභේද වාදී බෙදීම් උග්‍ර කරන එල්ටීටීඊ යේ මෙවැනි ප්‍රහාර ප්‍රතිගාමී වන අතර මේවා පොලිස් රාජ්‍ය කටයුතු සඳහා ආන්ඩුවට ආවරණයක් සම්පාදනය කරයි.

ආන්ඩුව විසින් යලි අවුලවන ලද යුද්ධයට ද එහි බලපෑම යටතේ වර්ධනය වන ජීවන කොන්දේසි වල ට ද එරෙහිව වැඩෙන විරෝධය තුල පසුගිය ඉරිදා කොළඹ හමුදා මෙහෙයුම සිදු වූවේ. මෙම සෝදිසි මෙහෙයුම දෙමල ජනතාවට එරෙහි ව සිදු කෙරුනු අතර මාධ්‍යයනට ද විරුද්ධ පක්ෂ දේශපාලනඥයින්ට ද සහ තම ප්‍රතිපත්ති විවේචනය කරන ඕනෑම කෙනෙකුට ද එරෙහිව ආන්ඩුව උග්‍ර මර්දනකාරී ක්‍රමයන් අනුගමනය කරයි.

අගනුවර යුධ නීතිය පැනවීම සඳහා පෙර හුරුවක් ලෙස ආන්ඩුව සහ හමුදාව මෙම මෙහෙයුම සිදු කර ඇතැයි යන්න ප්‍රතික්ෂේප කල නොහැක.

© www.wsws.org